රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 09/2014

මගේ අංකය : EST-4/PEMNT/03/0225

රාජ්‍ය පරිපාලන සහ

ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

නිදහස් චතුරස්‍රය

කොළඹ 07.

2014.12.26

අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගෙන**

**ඇති සේවකයින් සඳහා 2015 අයවැය යෝජනා අනුව ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 හි 03 ඡේදය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. එකී ඡේදයේ විධිවිධාන පරිදි තාවකාලික, අනියම් (දෛනික), ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත (ඇ), (ඉ), (ඊ) සහ (උ) යටතේ දැක්වෙන සේවා ගණයන්ට බඳවාගෙන ඇති සේවකයින් ස්ථිර කිරීමේදී එකවර භාෂාව හෝ සාහිත්‍යය සහ ගණිතය ඇතුලුව අවම වශයෙන් විෂයයන් හය (06)කින් අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්ව සිටිය යුතුය. මෙහිදී ගණිතය විෂයය පමණක් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම අදාළ කරගත හැකිය.

03. මෙම චක්‍රලේඛ ලිපිය භාණ්ඩාගාරයේ එකඟතාව මත නිකුත් කරන ලදී.

පී.බී.අබේකෝන්

ලේකම්

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය